# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1943/8 - 2015 නොවැම්බර් මස 30 වැනි සඳුදා - 2015.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 වන වගන්තියේ 2 (ඈ) වන උප වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

**අතිරේක පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව**

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව බත්තරමුල්ල, සෙත්සිරිපාය, 1 වන අදියර, තුන්වන මහල මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ''යෝජිත කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය'' සඳහා වූ අතිරේක පාරිසරික ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2015.12.01 දින සිට දින 30 ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

| | | |
|---|---|---|
| 1. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | - නො. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10. |
| 2. | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | - 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. |
| 3. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | - 3 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. |
| 4. | මධ්‍යම පරිසර අධිකාරිය | - නො. 104, පරිසර පියස, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. |
| 5. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - නාරාහේන්පිට, කොළඹ 05. |
| 6. | කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - ඩැම් වීදිය, කොළඹ 12. |
| 7. | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - නාරාහේන්පිට, කොළඹ 05. |
| 8. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - වත්තල. |



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

9. කොළඹ මහ නගර සභාව - කොළඹ.

10. වත්තල ප්‍රාදේශීය සභාව - වත්තල.

11. ප්‍රාදේශීය කාර්යාලය, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව - රේගුව පාර, මීගමුව.

මෙම යෝජිත කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2015.12.01 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
අධ්‍යක්ෂ ජනරාල්.

2015 නොවැම්බර් මස 30 වැනි දින,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10.

*දුරකථන අංක* : 011-2449754, 011-2387922, 011-2449197,
*ෆැක්ස් අංක* : 011-2438005, 011-2472623.

12 - 488

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.